**අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සේවක වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු. 500,000 ක් අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ප්‍රතිපූර්ණ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්ට අදාළව අයනොවී පැවති රු. 143,120 ක ව්‍යාපාර බදු ආදායම් කපා හැරීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අතපසු වීමකින් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කළ බව. | වර්ෂයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ධීවර මත්ස්‍ය වෙළඳ සැල බදු දීමේදී අයකර තිබූ රු. 131,039 ක එක්වන් මුදල ආදායමක් ලෙස ගිණුම්ගත නොකර විවිධ තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආදායමක් ලෙස ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී කඩ කාමරයක් බදු දීමේදී බදුකරුගෙන් ලැබිය යුතු රු. 80,000 ක එක්වන් මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත ලබාදී තිබූ රු.3,000,000 ක පුනරාවර්තන වියදම් ආධාරය ප්‍රාග්ධන ආදායම් හා ආදායම් ආධාර ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙම ආදායම වෙනත් ආදායමක් ලෙස ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර කුලී සඳහා ඉකුත් වර්ෂ වල පුද්ගලයන් 13 දෙනෙකු විසින් වැඩිපුර ගෙවා තිබූ රු.141,250 ක මුදල ණයහිමියන් යටතේ ගිණුම්ගත නොකර කලින් ලද ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව සභාවට නොලැබෙන 2020 වර්ෂයට අදාළ රු. 296,600 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර ඒකක 88 ක් සඳහා නඩු පැවරීම මත ලැබිය යුතු ව්‍යාපාර හා බලපත්‍ර ගාස්තු ආදායම රු. 97,065 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේ සිට නඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති නිසා මෙම වෙනස සිදුව ඇති බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කර තිබූ මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 04 ක් සඳහා ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන රු. 71,362 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බව. | ණයගැති, ණයහිමි ප්‍රතිපාදන වෙන්කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සභාවට අයත් පුස්තකාල 03 ක් සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබී තිබූ රු. 39,995 ක වට්ටම ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ලද වට්ටම් ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 10 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු. 3,631,075 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු. 196,105 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | විස්තරාත්මක උපලේඛන ඉදිරියේදී සකස් කිරීමට සහ නිරවුල් නොවූ ගනුදෙනු ශේෂය වසර ගණනාවක සිට පැවත එන ශේෂයක් බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙක ඉක්මවූ රු. 959,758 ක තැන්පතු ශේෂ 33 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.604,332 ක් නිරවුල් කළ අතර රු. 101,275 ක් මරණ පාරිතෝෂික මුදලක් බවත්, ඉතිරි රු. 254,150 පිළිබඳව ගැටලු පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) වගන්තිය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී දින 62 ක් වෙනුවෙන් නිලධාරියකුට රු.135,584 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | නිවාඩු දින වැටුප් ලබාගෙන ඇති දිනයන්හි පැමිණීම හා පිටවීම සනාථ කිරීමට පැමිණීමේ ලේඛනය, බැහැර ලේඛනය හා ක්ෂේත්‍ර සටහන් පොත උපයෝගී කරගෙන ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,421,128 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,979,500 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 802,000 | 747,070 | 781,430 | 31,030 | 761,000 | 707,660 | 673,540 | 65,390 |
| කුලී | 13,966,850 | 13,401,004 | 13,654,221 | 230,914 | 13,460,401 | 14,935,546 | 11,989,306 | 484,131 |
| බලපත්‍ර ගාස්තු | 2,499,480 | 3,088,621 | 3,224,565 | 125,881 | 1,956,270 | 2,887,873 | 2,631,641 | 261,825 |
| වෙනත් ආදායම් | 143,796,662 | 46,610,639 | 45,279,519 | 4,117,440 | 2,294,930 | 2,212,711 | 1,803,677 | 2,786,320 |
| **එකතුව** | **161,064,992** | **63,847,334** | **62,939,735** | **4,505,265** | **18,472,601** | **20,743,790** | **17,098,164** | **3,597,666** |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර 25 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු.31,030 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2013 වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ වසම් 4 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 10 කට ආසන්න කාලයක් ගතවී ඇතත් ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී දේපල තක්සේරුකර වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව. | දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දෙබොක්කාව කඩකාමර අංක 04 හි අයිතිය 2022 ජුලි 28 දින වෙනත් අයෙකුට පවරාදී තිබූ අතර එම පැවරීමේදී අයකළ යුතු රු. 80,000 ක එක්වන් මුදල් විගණිත දිනය වූ 2023 ජනවාරි 30 දින වන විටත් අයකර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අය කරන බව. | හිඟ එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ වාහන කුලියට දීම මත ලැබිය යුතු රු.190,880 ක වාහන කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 26,222 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කළ බවත්, ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,378,868 ක් හා රු.3,295,294 ක් විය. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම.

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි අධිකාරිය විසින් කසළ කළමනාකරණය සඳහා සභාවට ලබාදී තිබූ ඉඩමෙහි නොදිරන කසළ බැහැර කරන ස්ථානය පස්වලින් යට කිරීම පමණක් සිදුකර තිබූ අතර පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි ඝන අපද්‍රව්‍ය තුනී පස් තට්ටුවකින් ආවරණය කිරීම සිදුකරන බව. | පරිසර හිතකාමීව ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රන්න කසාගල මාර්ගයේ සිට වැලම්ටි හංදිය දක්වා වූ සභා මාර්ගයකින් 2019 පෙබරවාරි 21 දින සිට වසරක කාලයක් පස් ප්‍රවාහනය කිරීමට පුද්ගලයෙකුට රු. 50,000 ක බද්දක් අයකර අනුමැතිය ලබාදී තිබුණු අතර, පස් ප්‍රවාහනයෙන් පසු මාර්ගය නැවත යථා තත්ත්වයට පත්කර නොතිබියදී එම බද්ද මත නැවත වරක් 2022 වර්ෂයේ ජනවාරි 02 සිට දෙසැම්බර් 06 දක්වා අවසරය ලබාදී තිබුණි. | කලින් ලද ඇප මුදල හිලව් කර ගිවිසුම දීර්ඝ කිරීමට සභාපතිවරයා ලිඛිතව උපදෙස් ලබාදී ඇති බව. | මාර්ගය පරීක්ෂා කර තත්ත්ව වාර්තාවක් ලබාගෙන අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුල ස්ථාපනය කර නඩත්තු කරනු ලබන වීථි පහන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙන ඒවා අංකනය කර ලේඛනගත කිරීම සමාලෝචිත වර්ෂයේදී අවසන් කර නොතිබුණු බැවින් සභාව විසින් වියදම් දරා නඩත්තු කරනු ලබන විදුලි පහන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සභාව සතුව නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් නඩත්තුව වෙනුවෙන් රු. 2,240,843 ක් සභා අරමුදලින් වියදම් දරා තිබූ අතර, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක PE/01/01 දරන ලිපිය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් දරන ලද වියදම විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | විදුලිබල මණ්ඩලය සමඟ මෙතෙක් ගිවිසුම්ගත වීමට නොහැකි වූ බව. | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය පරිදි කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 හා 2019 වර්ෂයේදී අවසන් වරට බදුදී තිබූ සභාව සතු වාර්ෂිකව බදු දෙන දේපල 02 ක් සමාලෝචිත වර්ෂයේදී බදු දීමට අපොහොසත් වී තිබුණි. | මෙම දේපළ බදු ගැනීමට බදුකරුවන් ඉදිරිපත් නොවීම නිසා බදු අය කිරීම සභාව විසින්ම සිදුකළ බව. | බදු කොන්දේසි ලිහිල්කර ටෙන්ඩර්කර බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට ගනු ලබන ඉඩම් 140 ක නීත්‍යානුකූල අයිතිය සහ ලද දිනයද නිශ්චිතව සඳහන්ව නොමැති වාහන හා යන්ත්‍රෝපකරණ 4 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා මහවැලි අධිකාරිය දැනුවත් කළ අතර වාහන හා යන්ත්‍රෝපකරණ 04 සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ක්‍රීට් කැටගල් අල්ලා සංවර්ධනය කරනු ලැබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 16 කට අදාළව මිලි මීටර් 37.5 ප්‍රමාණයේ ගල් සැපයීම සහ ප්‍රවාහනය වෙනුවෙන් රු. 4,106,786 ක් ගෙවීම් කර තිබුණද එහිදී ගල් සම්පිණ්ඩනතා සංගුණකය නියමිත ප්‍රමිතියට වඩා අඩු මට්ටමක පැවතුණි. | සියලුම කර්මාන්ත වල සම්පීඩ්‍යතාවය සියයට 95 සිට සියයට 100 අතර පැවති නිසා ගෙවීම් කළ බව. | ගෙවීම් කිරිම සඳහා නියමිත ප්‍රතිශතයට අතුරන ලද ABC සම්පිණ්ඩනය වී තිබිය යුතුය. |
| (ආ) | ආදාහනාගාරයට ප්‍රවේශ මාර්ගයේ ඉතිරි කොටස හා වාහන නැවතුම් ස්ථානයේ කැටගල් අතුරා කානුව හා පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තය යටතේ කොන්ක්‍රීට් කැටගල් ඇල්ලීම සිදුකර කොන්ක්‍රීට් කැටගල් සඳහා රු. 3,258,756 ක් ගෙවීම් කර තිබුණි. කොන්ක්‍රීට් කැට ගලක තිබිය යුතු සම්පීඩ්‍යතාවය 30 N/mm2 වියයුතු වුවත්, තත්ත්ව පරීක්ෂණයට ලක්කර තිබූ කොන්ක්‍රීට් කැටගල් 36 න් ගල් 07 ක නියමිත සම්පීඩ්‍යතාවය නොතිබියදී කොන්ත්‍රාත්කරු වෙත සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. | අතුරන ලද කැටගල් ගලවා ඉවත් කර නැවත කැටගල් අල්ලා නව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කළ බව. | ක්ෂේත්‍රයෙහි අතුරන ලද කැටගල් වල නියමිත සම්පීඩ්‍යතාවය තිබිය යුතුය. |
| (ඇ) | කුඹුක්මුල්ල ජන උදානගම ළමා උද්‍යානය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු. 6,403,054 ක් ගෙවීම් කර තිබුණි. | | |
| i. | මෙම කර්මාන්තයේ වර්ග මීටර් 252 ක ප්‍රමාණයෙන් යුතුව PVC දැල්වැට ඉදිකිරීම වෙනුවෙන් රු. 1,119,943 ක් ගෙවීම් වාර්තාවට ඇතුළත් කර තිබුණද දැල්වැටෙහි නියමිත පරිදි තීන්ත ආලේප කර නොතිබූ අතර වැට සඳහා යොදා තිබූ GI බට මල බැඳීම් වලට ලක්ව තිබුණි. | ගෙවීම් කිරීමට පෙර අඩුපාඩු කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඇස්තමේන්තුව අනුව වැඩ නිමකර තිබිය යුතුය. |
| ii. | ළමා උද්‍යානය ඉදිකළ භූමියෙහි පස් පිරවීම සඳහා පිටතින් පස් කියුබික් මීටර් 789 ක් ලබාගත් බව දක්වා රු. 10,615,568 ක් ගෙවීම් වාර්තාවට ඇතුළත් කර තිබුණද පිටතින් පස් ලබා ගැනීම සඳහා භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් බලපත්‍රය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පස් කැනීම හා ප්‍රවාහනය නියාමනය කිරීම සඳහා රජයේ වෙනත් ආයතන පවතින නිසා ඒ පිළිබඳව අවධානය යොමු නොකළ බව. | ගෙවීම් කළ පස් කියුබ් ප්‍රමාණය තහවුරු කිරීමට අදාළ සාක්ෂි ලබාගත යුතුය. |
| (ඈ) | සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 24 කට අදාළව මිලිමීටර් 37.5 ගල් සඳහා , හැඩයම් වැඩ සඳහා , කොන්ක්‍රීට් සඳහා හා ගල්කුඩු ප්‍රවාහනය සඳහා වැඩිපුර ගෙවීම යන කරුණු වලට අදාළව එකතුව රු. 191,138 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් රඳවුම් මුදලින් සහ කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කර්මාන්ත පරීක්ෂාව - 2021 වර්ෂයට අදාළව නිකුත් කර තිබූ විගණන විමසුමක කර්මාන්ත 02 කට අදාළව වැඩිපුර ගෙවා තිබූ රු. 497,223 ක් අයකර ගැනීමට මුදල් රෙගුලාසි 155 හි විධි විධාන අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අතරදවුම් මුදලින් අයකිරීමට කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |